P.C.7

№ 001147

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Povince

දෙවන වාර පරීක්ෂණය 2022
Second Term Test

7 ශ්‍රේණිය	විද්‍යාව	කාලය : පැය 2 යි

13

I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. අපුෂ්ප ශාකයක් වන්නේ,
    (1) කරපිංචා (2) මඩු (3) උක් (4) ක්‍රෝටන්

02. ශාක මුල්වලින් ඉටුකෙරෙන ප්‍රධාන කාර්යයක් වන්නේ,
    (1) ශ්වසනය යි.
    (2) ජලය හා ඛණිජලවණ අවශෝෂණය යි.
    (3) ප්‍රභාසංස්ලේෂණය යි.
    (4) ආහාර සංචිත කිරීම යි.

03. අප අවට පරිසරයේ කොස් ශාකය බහුලව නිරීක්ෂණය කළ හැක. මෙම ශාකය සම්බන්ධ **අසත්‍ය** ප්‍රකාශය කුමක් ද?
    (1) කඳ අතු බෙදී පවතී.
    (2) ද්විබීජපත්‍රී ශාකයකි.
    (3) ඒකබීජපත්‍රී ශාකයකි.
    (4) මුදුන් මූල පද්ධතියක් ඇත.

04. සමහර ද්‍රව්‍ය පිරිමැදීම සිදුකළ විට ඒවාට සැහැල්ලු ද්‍රව්‍ය ආකර්ෂණය වන බව පළමුවෙන්ම පෙන්වා දුන් විද්‍යාඥයා වන්නේ,
    (1) විලියම් ගිල්බර්ට් ය.
    (2) සර් අයිසැක් නිව්ටන් ය.
    (3) බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් ය.
    (4) J.J. තොම්සන් ය.

05. පිරිමැදීමෙන් ආරෝපණය කරගත් වස්තු දෙකක් X හා Y මගින් දැක්වේ. ඒවා ලංකළ විට ආකර්ෂණයක් සිදුවේ. ඒ අනුව X හා Y,
    (1) X හා Y ධන ලෙස ආරෝපණය වී තිබුණි.
    (2) X හා Y ඍණ ලෙස ආරෝපණය වී තිබුණි.
    (3) X ධන ලෙසත් Y ඍණ ලෙසත් ආරෝපණය වී තිබුණි.
    (4) X හා Y දෙකටම ආරෝපණයක් නොතිබුණි.



06. ස්ථිති විද්‍යුත් ආරෝපණ ගබඩා කළ හැකි උපාංගය හා එහි සංකේතය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක් ද?
    (1) විද්‍යුත් කෝෂය 
    (2) බල්බය
    (3) ධාරිත්‍රකය 
    (4) ධාරිත්‍රකය 

07. රසායනික ශක්තිය, විද්‍යුත් ශක්තිය බවට පත්කළ හැකි විද්‍යුත් ප්‍රභවයක් **නොවන්නේ,**

(1) වියළි කෝෂය
(2) සූර්ය කෝෂය
(3) සරල කෝෂය
(4) මෝටර් රථ බැටරිය

08. විද්‍යුත් ප්‍රභවයක ධාරාව ගලන සම්මත දිශාව වන්නේ,

(1) (+) අග්‍රයේ සිට (−) අග්‍රය දෙසට.
(2) (−) අග්‍රයේ සිට (+) අග්‍රය දෙසට.
(3) (+) අග්‍රයේ සිට (+) අග්‍රය දෙසට.
(4) (−) අග්‍රයේ සිට (−) අග්‍රය දෙසට.

09. උක් ශාකයේ කඳෙන් ලබාගන්නා යුෂයෙහි අඩංගු සීනි වර්ගය වන්නේ,

(1) ග්ලූකෝස් ය.
(2) සුක්රෝස් ය.
(3) ලැක්ටෝස් ය.
(4) මාල්ටෝස් ය.

10. රූපයේ දැක්වෙන්නේ ආලෝකය පාඩමට අදාළව සිදුකරන ලද ක්‍රියාකාරකමකි.
මෙම ක්‍රියාකාරකමෙන් නිරීක්ෂණය කළ හැකි වන්නේ,

(1) තිරය මත පැහැදිලි ඡායාවක් ඇතිවීම.
(2) තිරය මත ඡායාව හා උපඡායාව ඇතිවීම.
(3) තිරය මත උප ඡායාවක් ඇතිවීම.
(4) තිරය මත ඡායාවක් ඇති නොවීම.



11. වාහනයක පැති කණ්ණාඩිය ලෙස යොදා ගන්නේ,

(1) උත්තල දර්පණය යි.
(2) අවතල කාචය යි.
(3) අවතල දර්පණය යි.
(4) තල දර්පණය යි.

12. ජීවයේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය,

(1) පටකය යි.
(2) අවයවය යි.
(3) සෛලය යි.
(4) පද්ධතිය යි.

13. පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනීමට උපකාරී වන තරංග,

(1) භූ කම්පන තරංග වේ.
(2) ධ්වනි තරංග වේ.
(3) ආලෝක තරංග වේ.
(4) මේ කිසිවක් නොවේ.

14. වෛරස් නිරීක්ෂණය සඳහා යොදාගත හැකි උපකරණය,

(1) ආලෝක අන්වීක්ෂය යි.
(2) සරල අන්වීක්ෂය යි.
(3) අත් කාචය යි.
(4) ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂය යි.

15. ජලයේ ගුණ හඳුනාගැනීමට සිදුකළ පරීක්ෂණයක රූප සටහනක් පහත දැක්වේ.

නිරීක්ෂණය :- A ඇටවුමේ උෂ්ණත්වමාන පාඨාංකයට වඩා B ඇටවුමේ උෂ්ණත්වමාන පාඨාංකය අඩුය.



මෙම නිරීක්ෂණය මගින් එළඹිය හැකි නිගමනයට අදාළ ජලයේ ගුණය,

(1) ද්‍රාවක ගුණය වේ.
(2) වාෂ්පශීලී ගුණය වේ.
(3) සිසිල කාරක ගුණය වේ.
(4) මේ කිසිවක් නොවේ.

16. ආම්ලික ද්‍රව්‍ය පමණක් අන්තර්ගත ද්‍රව්‍ය කාණ්ඩය වනුයේ,

(1) විනාකිරි, දෙහි, සබන්
(2) දෙහි, සියඹලා, විනාකිරි
(3) දෙහි, අළු, විනාකිරි
(4) සබන්, අළු, හුණු

17. කොඳුඇට පෙළක් හෙවත් කශේරුවක් සහිත සත්ත්වයෙකු නොවන්නේ,

(1) කැහිබෙල්ලා ය.
(2) ගොලුබෙල්ලා ය.
(3) ඉබ්බා ය.
(4) ගැරඬියා ය.

18. බැටරි අම්ලය (බැටරි ඇසිඩ්) ලෙස හඳුන්වන්නේ,

(1) තනුක කරන ලද හයිඩ්‍රොක්ලෝරික් අම්ලයයි.
(2) තනුක කරන ලද සල්ෆියුරික් අම්ලයයි.
(3) තනුක කරන ලද නයිට්‍රික් අම්ලයයි.
(4) තනුක කරන ලද සිට්‍රික් අම්ලයයි.

19. තාප ශක්තිය මගින්,

(1) ද්‍රව්‍යවල හැඩය වෙනස් වේ.
(2) වර්ණය වෙනස් වේ.
(3) ප්‍රසාරණය සිදු වේ.
(4) මේ සියල්ලම සිදුවේ.

20. වායු දූෂණය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

(1) පොසිල ඉන්ධන දහනය අවම කිරීම.
(2) වනාන්තර ආරක්ෂා කිරීම.
(3) කුණුකසළ පිලිස්සීම වෙනුවට ප්‍රතිචක්‍රීකරණය කිරීම.
(4) මේ සියල්ලම සිදු කිරීම.

II කොටස

- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

01. (A) විද්‍යාගාරයේ රාක්කය මත තිබූ රසායනික ද්‍රව්‍යයක් අඩංගු වීදුරු බෝතලයක ලේබලය ගැලවී තිබුණි. මෙම රසායනික ද්‍රව්‍යය අම්ලයක් ද, භස්මයක් ද උදාසීන ද්‍රව්‍යයක් ද යන්න හඳුනා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා විද්‍යා ගුරුතුමිය ලිට්මස් කඩදාසි කැබලි කිහිපයක් භාවිත කරන ලදී.

(i) (a) ලිට්මස් කඩදාසිවල වර්ණ දෙක නම් කරන්න.

(b) ලිට්මස් හැරුණුවිට මේ සඳහා යොදාගත හැකි වෙනත් කඩදාසි වර්ගයක නම ලියන්න.

(ii) මෙම කඩදාසි හැරුණ විට විද්‍යාගාරයේ භාවිතවන වෙනත් දර්ශක දෙකක් ලියන්න.

(iii) (a) ලේබලය ගැලවී තිබූ බෝතලයේ අඩංගු රසායනික ද්‍රව්‍ය පරීක්ෂා නලයකට ගෙන එයට නිල් ලිට්මස් කැබැල්ලක් දැමූවිට එය රතුපාට විය. මෙම ද්‍රව්‍යය කුමක් ද?

(b) මෙම ද්‍රව්‍ය සඳහා උදාහරණයක් ලියන්න.

(B) විදුනි නිවසේ දී දර්ශක ලෙස පොකුරු වදමල් තැම්බූ යුෂ හා පුවක් තැම්බූ යුෂ භාවිතා කරන ලදී.

(i) වද හා පුවක් ශාක සපුෂ්ප ශාකවලට අයත් වේ. සපුෂ්ප ශාක බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කර වද හා පුවක් ශාක එම කොටස් දෙකට බෙදා දක්වන්න.

(ii) එම ශාක දෙකේ

(a) මූල පද්ධතිය

(b) ශාක කඳේ වෙනස්කමක් බැගින් සසඳා ලියන්න.

(iii) වද මලේ පුමාංගය ඇඳ කොටස් නම් කරන්න.

(C) විද්‍යාගාරයේ දී හඳුනාගත් අම්ලය රසායනික ද්‍රව්‍යයක් වේ. එහි අඩංගු ශක්තිය රසායනික ශක්තිය වේ.

(i) මෙම අම්ලයට මැග්නීසියම් ලෝහ කැබලි දැමූවිට ලැබෙන නිරීක්ෂණ 02 ක් ලියන්න.



(ii) (a) නිවසේ දී භාවිතයට ගන්නා රසායනික ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(b) ඔබ ඉහත ii(a) හි ලියූ රසායනික ද්‍රව්‍යයක් ප්‍රයෝජනයට යොදා ගන්නා අවස්ථාවක් ලියන්න.

02. (A) ජීවීන් විවිධ පරිසර තත්ත්ව හමුවේ සාර්ථකව ජීවත්වීමට විවිධ අනුවර්තන දක්වයි.

(i) (a) අනුවර්තන යනු කුමක් ද?

(b) අනුවර්තන තුළින් ජීවීන් සපුරා ගන්නා අවශ්‍යතා 02 ක් ලියන්න.

(ii) (a) ශරීර වර්ණය පරිසරයේ වර්ණයට ගැලපීම නිසා සතුන් පරිසරයෙන් වෙන්කර හඳුනා ගැනීම අපහසු වේ. මෙය කෙසේ හැදින්වේ ද?

(b) මෙම අවස්ථාවට උදාහරණයක් ලියන්න.

CamScanner

(B) සතුන්ගේ පැවැත්ම සඳහා හැඩය උපකාරීවන බව පෙන්වීමට සිදුකල පරීක්ෂණයක රූප සටහනක් පහත දැක්වේ.



A හා B ලෙස සකස් කරගත් බණ්ඩක්කා කැබලි දෙක ජලයේ ගමන් කිරීමට සැලැස්වීම.

(i) මෙම ක්‍රියාකාරකමේ නිරීක්ෂණය කුමක් ද?

(ii) (a) දෙකෙලවර උල් හැඩයක් ගත් B ව්‍යුහයේ හැඩය හැඳින්වෙන නම කුමක් ද?

(b) මෙම හැඩය සතුන්ගේ පැවැත්මට උපකාරී වන්නේ කෙසේ ද?

(iii) මෙම හැඩය ගන්නා සත්ත්ව කාණ්ඩ දෙක නම් කරන්න.

03. (A) තල දර්පණයකින් සෑදෙන ප්‍රතිබිම්බයක ලක්ෂණ හඳුනාගැනීමට සිදු කළ ක්‍රියාකාරකමකට අදාළ රූප සටහනක් පහත දැක්වේ.



(i) (a) තල දර්පණයෙන් නිරීක්ෂණය වන ප්‍රතිබිම්බයේ ලක්ෂණ 02 ක් ලියන්න.

(b) මෙම රූප සටහන පිළිතුරු පත්‍රයේ ඇඳගෙන සෑදෙන ප්‍රතිබිම්බය කඩ ඉරිවලින් ඇඳ පෙන්වන්න.

(ii) දර්පණ වලින් ප්‍රතිබිම්බ සෑදෙන්නේ ආලෝකයේ කුමන ගුණය නිසා ද?

(iii) තල දර්පණ භාවිත වන අවස්ථා දෙකක් ලියන්න.

(B) තල දර්පණ දෙකක් විවිධ කෝණයන්ගෙන් ආනතව තබා ඇතිවිට ප්‍රතිබිම්බ කිහිපයක් සෑදේ.

(i) (a) දර්පණ දෙක 90^0 ක් ආනතව ඇතිවිට සෑදෙන ප්‍රතිබිම්බ සංඛ්‍යාව කීය ද?

(b) ප්‍රතිබිම්බ 05 ක් සෑදීමට දර්පණ දෙකක් ආනතව පැවතිය යුතු කෝණය කුමක් ද?

(ii) විවිධ අවස්ථාවල දී වක්‍ර දර්පණ භාවිත වේ. පහත සඳහන් අවස්ථාවල දී භාවිත වන දර්පණ වර්ගය කුමක් ද?

(a) දන්ත වෛද්‍යවරු දත් පරීක්ෂා කිරීම සඳහා

(b) වාහනවල පැති කණ්නාඩි සඳහා

(iii) වාහනවල පැති කණ්නාඩි මගින් සෑදෙන ප්‍රතිබිම්බයේ ලක්ෂණ 02 ක් ලියන්න.

04. (A) විදුනි විද්‍යාව සටහන් පොතේ ඇඳ තිබූ ආහාර ජීර්ණ පද්ධතියේ හා ශ්වසන පද්ධතියේ රූප සටහන්, ඇගේ කුඩා නැගණිය විසින් කොටස් කිහිපයකට කපා දමා තිබුණි. එම කොටස් පහත දැක්වේ.



(i) A, B, C සහ D අතරින් ආහාර ජීර්ණ පද්ධතියට අයත් කොටස් තෝරා ලියන්න.

(ii) (a) C රූපයේ අංක 5 ලෙස නම්කර ඇති අවයවය කුමක් ද?

(b) ආහාර ජීර්ණය සම්පූර්ණ වී ජීර්ණ ඵල දේහයට අවශෝෂණය වන අවයවය දැක්වෙන අංකය සහ එම අවයවය නම් කරන්න.

(iii) (a) ශ්වසනය යනු කුමක් ද?

(b) ශ්වසන පද්ධතියට හා ආහාර ජීර්ණ පද්ධතියට පොදු වූ කුටීරය කුමක් ද?

(B) ශාකයක විවිධ අවයව හා පද්ධති දැක්වෙන රූප සටහනක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය වේ. එම රූප සටහන පහත දැක්වේ.



(i) ශාකයේ A හා B ලෙස හැඳින්වෙන පද්ධති 2ක නම් කරන්න.

(ii) A පද්ධතියට අයත් අවයව 2 ක් ලියන්න.

(iii) ජලය හා ඛණිජලවණ පරිවහනය කරන පටකය කුමක් ද?

(iv) (a) මෙම ශාකය ඒකබීජ පත්‍රී ශාකයක් ද? ද්විබීජපත්‍රී ශාකයක් ද?

(b) ඉහත (iv)a හි ඔබ සඳහන් කළ පිළිතුර ඉදිරිපත් කිරීමට හේතුවක් ලියන්න.

05. (A) එදිනෙදා ජීවිතයේ විවිධ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා විවිධ ආකාරයේ විද්‍යුත් ප්‍රභව භාවිත වේ.

(i) (a) විද්‍යුත් ප්‍රභව සඳහා උදාහරණ **දෙකක්** ලියන්න.

(b) ඉහත ප්‍රභව දෙකෙහි විදුලිය උත්පාදනය වන ආකාරය ලියන්න.

(ii) විද්‍යුත් ධාරාව මනින සම්මත ඒකකය වචනයෙන් ලියන්න.

(B) විදුලි ධාරාවක් නිපදවා ගැනීමට විද්‍යාගාරයේ සැකසූ ඇටවුමක් පහත දැක්වේ.



(i) මෙම ඇටවුම හැඳින්වෙන්නේ කෙසේ ද?

(ii) මෙහි X ලෙස නම් කර ඇති ද්‍රවය කුමක් ද?

(iii) මෙහි (+) අග්‍රය හා (−) අග්‍රය පිළිවෙලින් නම් කරන්න.

(iv) මෙම ඇටවුමේ දුර්වලතා 02 ක් ලියන්න.

06. (A) වර්ණ ගන්වන ලද ලී කුඩු භාවිත කරමින් පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය ආදර්ශනය කිරීමට සැකසූ නිර්මාණයක් පහත දැක්වේ.



(i) මෙහි A හා B ස්ථර දෙක පිළිවෙලින් නම් කරන්න.

(ii) ද්‍රව තත්ත්වයේ පවතින අයන් සහ නිකල් පවතින්නේ කුමන ස්ථරයේ ද?

(iii) කබොලෙන් ලබා ගත හැකි මිනිසාට ප්‍රයෝජනවත් සම්පත් 02 ක් ලියන්න.

(iv) ශ්‍රී ලංකාව පිහිටා ඇති භූ තැටිය නම් කරන්න.

(B) වායුගෝලය පොළව මට්ටමේ සිට 700 km ක් පමණ ඈතට විහිදී පවතී. වායුගෝලය ප්‍රධාන ස්ථර 05 ට බෙදා ඇත.

(i) ප්‍රධාන ස්ථර 5 ට බෙදා දැක්වීමට හේතු වූ වායුගෝලයේ වෙනස්වන සාධක දෙක කුමක් ද?

(ii) (a) ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ කුමන ස්ථරයේ ද?

(b) ඕසෝන් ස්ථරයේ වැදගත්කම කුමක් ද?

(iii) වායුගෝල දූෂණයට හේතුවන වායුමය දූෂකයක් හා අංශුමය දූෂකයක් බැගින් ලියන්න.

WWW.PastPapers.WIKI
Download past papers, notes, and more from Past Papers Wiki!
CamScanner

• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440